# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 29 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 ඔක්තෝබර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 ඔක්තෝබර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.50 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

# 2003 අංක 29 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 ඔක්තෝබර් මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 15/99

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2003 අංක 29 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ :— ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ඕ) වන ඡේදයේ "විධිමත් කිරීම, පාලනය කිරීම සහ මෙහෙයවීම, සහ" යන වචන වෙනුවට "විධිමත් කිරීම, පාලනය කිරීම සහ මෙහෙයවීම; " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ක) වන ඡේදයේ "අවශ්‍ය සම්බන්ධය ඇති කිරීම," යන වචන වෙනුවට "අවශ්‍ය සම්බන්ධය ඇති කිරීම ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (ක) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :—

"(ග) මේ පනත යටතේ සලසා ඇති විවිධ යෝජනා ක්‍රමවලට අදාළ වන තොරතුරු ඇතුළත් කර ඇති අත්පොත් පිළියෙල කිරීම ;

(ච) පොදු අරමුණු වැඩිදියුණු කර ගැනීම සඳහා මණ්ඩලයේ අරමුණුවලට සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් සමාන අරමුණු ඇතිව ශ්‍රී ලංකාවේ හෝ පිටරට පිහිටා ඇති වෙනත් ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම සහ ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ජ) තේ කර්මාන්තයට අදාළ ප්‍රතිපත්ති පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් දීම ;

2-H 19152 - 4,500 (2003/07)

(ට) තේ කර්මාන්තයේ ආයෝජනය කිරීම් ප්‍රවර්ධනය කිරීම ; සහ

(ඩ) තේ කර්මාන්තය පිළිබඳ දත්ත එක් රැස් කිරීම හා බෙදා හැරීම. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරනු ලැබේ :—

“(1) මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු (මෙහි මින් මතු “සභාපතිවරයා” යනුවෙන් හඳුන්වනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තෙක් ;

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන නම් කරනු ලබන සාමාජිකයන්ගෙන් :—

(i) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(ii) වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(iii) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයන් දෙදෙනකු;

(iv) කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් නම් කරනු ලබන එම අධිකාරියේ නියෝජිතයකු ;

(v) පෞද්ගලික තේ කර්මාන්ත හිමියන්ගේ සංගමය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්.) අමතා නම් කරනු ලබන එම සංගමයේ නියෝජිතයකු ;

(vi) (291 වන අධිකාරය වූ) ලංකා වැවිලිකරුවන්ගේ සංගමය යටතේ ස්ථාපිත ලංකා වැවිලිකරුවන්ගේ සංගමය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්.) අමතා නම් කරනු ලබන එම සංගමයේ නියෝජිතයකු ;

(vii) සමස්ත ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්.) අමතා නම් කරනු ලබන එම සංවිධානයේ නියෝජිතයකු ;

(viii) තේ අපනයනකරුවන්ගේ සංගමය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්.) අමතා නම් කරනු ලබන එම සංගමයේ නියෝජිතයකු ;

(ix) කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්.) අමතා නම් කරනු ලබන එම සංගමයේ නියෝජිතයකු;

(x) කොළඹ බ්‍රෝකර්වරුන්ගේ සංගමය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්.) අමතා නම් කරනු ලබන එම සංගමයේ නියෝජිතයකු ; සහ

(xi) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නිර්නායන පදනම් කොට තෝරා ගනු ලැබිය යුතු වෘත්තිය සමිති නියෝජනය කරනු ලබන සමාජිකයන් දෙදෙනකු,

මේ ඡේදයේ කාර්ය සඳහා "වෘත්තීය සමිතියක්" යන්නට (138 වන අධිකාරය වන) වෘත්තීය සමිති ආඥාපනතේ එයට දී ඇති අර්ථයම ඇත්තේ ය.

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) මණ්ඩලයේ සභාපතිවරයා ද, නම් කරනු ලැබූ සාමාජිකයන් ද පස් අවුරුදු කාලසීමාවක් ධුර දැරිය යුතු අතර, නැවත නම් කරනු ලැබීමට ඔවුහු සුදුසු වන්නෝ ය.".

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "අග්‍රාමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව" යන වචන අත්හැරීමෙන් ;

(4) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "අග්‍රාමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව" යන වචන අත්හැරීමෙන් ;

(5) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "අග්‍රාමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව" යන වචන අත්හැරීමෙන් ;

අන්තර්කාලීන විධිවිධාන.

**4**. මේ පනත ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන්නා වූ මණ්ඩලයේ සාමාජිකයන් මේ පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය යටතේ මණ්ඩලය නැවත සංස්ථාපනය කරන තෙක් එලෙස ධුර දැරීම දිගටම කරගෙන යා යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.